**උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ - අතිරේක මූල්‍යයනය, පළාත් සංරචකය - 2015**

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ - අතිරේක මූල්‍යයනය පළාත් සංරචකයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2012 නොවැම්බර් 19 දින එළඹී අංක 2890-එස්ආර්අයි(එස්එෆ්) දරන ණය ගිවිසුමේ (iv) ව්‍යවස්ථාවේ 4.04 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ - අතිරේක මූල්‍යයනය ණය ගිවිසුමට අනුව, උතුරු පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සහ උතුරු මැද පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන අතර, එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, උතුරු පළාත තුළ සහ ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය සහ දකුණු ප්‍රදේශය අතර මාර්ග සම්බන්ධතාවයන් වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘතියේ කටයුතු සමන්විත වනුයේ,

__ආ කොටස - පුනරුත්ථාපනය හා ප්‍රතිස්ථාපනය__

උතුරු පළාතේ පළාත් මාර්ග කිලෝමීටර් 50 ක් පුනරුත්ථාපනය කිරීම සහ තෝරා ගත් පාලම් පුනරුත්ථාපනය සහ / හෝ ප්‍රතිස්ථාපනය කිරීම.

__ඇ කොටස - පුනරුත්ථාපනය හා ප්‍රතිස්ථාපනය__

උතුරු මැද පළාතේ පළාත් මාර්ග කිලෝමීටර් 70 ක් පුනරුත්ථාපනය කිරීම සහ තෝරා ගත් පාලම් පුනරුත්ථාපනය සහ / හෝ ප්‍රතිස්ථාපනය කිරීම.

ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 4,377 කට සමාන එජඩො මිලියන 33.67 ක් වන අතර, ඉන් රු.මිලියන 3,757 කට සමාන එජඩො මිලියන 28.9 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) එකඟ වී තිබුණි. 2013 මැයි 31 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කර තිබුණු අතර, 2018 ජුනි 30 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදී හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ ( විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන වග.

(ඉ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(එ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඔ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වුයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, වනුයේ මාගේ මතය ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රිලංමබැ) ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වු ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 3 මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | උපයෝජනය කළ අරමුදල් 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 28.90 | 3,757 | 1,398 | 10.20 | 1,332 | 23.10 | 3,009.25 |
| ශ්‍රීලංර | 4.77 | 620 | 224 | 0.98 | 127 | 2.13 | 276.54 |
| එකතුව | 33.67 | 4,377 | 1,622 | 11.18 | 1,459 | 25.23 | 3,285.79 |

**3.2 භෞතික ප්‍රගතිය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිග කිලෝමීටර 75.65 ක්වූ පළාත් මාර්ග 7ක් , කිළිනොච්චි දිස්ත්‍රික්කයේ දිග කි.මී. 24.11ක් වූ පළාත් මාර්ග 4ක් සහ මුලතිව් දිස්ත්‍රික්කයේ දිග කි.මී. 24.49ක්වූ පළාත් මාර්ග 2ක් ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂා කර තිබුණි. ඒ අතුරින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියලුම පළාත් මාර්ගවල, කිළිනොච්චි දිස්ත්‍රික්කයේ පළාත් මාර්ග 2 ක සහ මුලතිව් දිස්ත්‍රික්කයේ එක් පළාත් මාර්ගයක පුනරුත්ථාපන කටයුතු 2015 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණි.

(ආ) මුලතිව් දිස්ත්‍රික්කයේ කිලෝමීටර 12.85 ක්වූ වට්ටපලෙයි - කෙප්පයිපිලවු - පුදුකුඩිඉරිප්පු මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණේ ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර වසර 2 ½ කට පසුව එනම් 2015 නොවැම්බර් 26 දින වන අතර 2016 මැයි 31 දිනට සියයට 12.5ක භෞතික ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. ප්‍රගති වාර්තා අනුව, 2014 දෙසැම්බර් 31 දින ආරම්භ කරන ලද කිළිනොච්චි දිස්ත්රික්කයේ අක්කරයාන්කුලම්හි ප්‍රධාන කැනල් මාර්ග 2 පුනරුත්ථාපන කටයුතු වල 2016 මැයි 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 45.5ක් ලෙස පෙන්නුම් කර තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භූමියේ තත්වයන් පිළිබඳව සමීක්ෂණයකින් තොරව සිදුකළ අවිධිමත් පස් පිරවුම් සහ තැලීම් හේතුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ කිරිගොල්ලෑව - හීරලුගම මාර්ගය සහ යකාවැව මහකෝන්ගස්කඩ මාර්ගයේ වැව් මතින් දිවෙන ස්ථාන කිහිපයකම මාර්ග තලයේ සහ මාර්ග උරහිස් වල ඉරිතැලීම් හා හානි වීම් සිදුවී ඇති බව විගණන නිලධාරින් විසින් 2016 මාර්තු 02 දින සිදු කරන ලද වැඩබිම් පරීක්ෂාවේදී අනාවරණය විය. අවිධිමත් පස් තැලීම් හේතුවෙන් උතුරු පළාතේ කෙන්නඩි මාර්ගය සහ කැට්ල්ෆාම් පිවිසුම් මාර්ගයේ ස්ථාන කිහිපයකම හානිවීම් හා උරහිස් සේදීයාම් සිදුවී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. තවද, කොන්ත්‍රාත්කරුවන්ගේ නඩත්තු කටයුතු වල අවිධිමත් බව හේතුවෙන් උතුරු පළාතේ ඔඩ්ඩුසුඩාන් - පුදුකුඩිඉරිප්පු - මාතලන් මාර්ගයේ තණ පිඩලි ඇල්ලීමේ කටයුතු වලින් සියයට 50කට වැඩි ප්‍රමාණයක් අසාර්ථක වුවද ඒ සඳහා රු.මිලියන 8.19ක මුදලක් ගෙවා ඇති බව 2016 අප්‍රේල් 11 වන දින සිදුකළ වැඩබිම් පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුම් අනුව, ව්‍යාපෘතිය යටතේ පුනරුත්ථාපනය කරන ලද මාර්ග, පළාත් මාර්ග අධිකාරින්ට භාර දීමෙන් පසු අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරි වර්ෂ 5ක කාලයක් සඳහා නඩත්තු කටයුතු සිදුකළ යුතුය. කෙසේ වුවද, මාර්ග නඩත්තු කටයුතු නියාමනය කිරීමට සහ ඊට අදාළ ගෙවීම් කිරීමට කොන්ත්‍රාත් ගිවිසුම් වල විධිමත් යාන්ත්‍රණයක් දක්වා නොතිබුණි.

**3.4 මතභේදයට තුඩු දෙන කරුණු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) 2007 අප්‍රේල් 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33ට පටහැනිව උතුරුමැද පළාත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය මඟින් උතුරුමැද පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියෙන් 2014 වර්ෂයේ සිට උතුරු මැද පළාත් සභාවේ නිළධාරින් තිදෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණි.සමාලෝචිත වර්ෂය තුළ එම නිළධාරින්ගේ ස්ථිර තනතුරේ මාසික වැටුපෙන් 1/6 ක දීමනාවක් ලෙස රු. 305,908ක් ගෙවා තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දින වන විට පළාත් මාර්ග 13කින්, පළාත් මාර්ග 10ක පුනරුත්ථාපන කටයුතු නිමකර පළාත් මාර්ග අධිකාරියට භාරදී තිබුණි. කෙසේවුවද, ණය ගිවිසුමේ සඳහන් කර ඇති පරිදි ව්‍යාපෘතියේ කටයුතු 2018 ජූනි 30 දින දක්වා පවත්වා ගෙන යාමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ ඉතිරි කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතිය මඟින් ඉටුකළ යුතු කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට අදාළ නියමිත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් ක්‍රියාකාරි සැලැස්මක් නොතිබූ බව නිරීක්ෂණය විය.